පළාත් සභා පිළිබඳ බොරු සංවාදය

ආණ්ඩුව ඇතුලේත්, ඉන් පිට ඉන්න දේශපාලකයන්ද දේශපාලකයන් නොවන අයද මේ දිනවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය පිළිබඳ සංවාදයක නිරත වී සිටින බව දැකගත හැකිය. සමහරු 13 ඕනෑ යයි කියති. සමහරු 13 මදි ඒ නිසා 13 ජලස් ඕනෑ යැයි කියති. අනිත් අතට තවත් සමහරු 13 මුළුමනින්ම එපායැයි කියති. ඊලඟ පිරිස ඉඩම් බලතල පොලිස් බලතල නැතුව 13 කමක් නැතැයි කියති. මේ කතා අස්සේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කෙටි කාලයකට වුවත් ජනතාවට තමන්ගේ සැබෑ ප්‍රශ්න අමතක කරවීමට සමත් විය. 13 ඕනේ, 13 එපා කතා අස්සේ සැඟවී තිබුන ඇත්ත නම් එයයි. අනික් අතට ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ජාතිවාදය ශක්තිමත් ලෙස මුල්බැස තිබේ. ඡන්දයක් ළංවන විට ජවිපෙ හැර අනික් පක්ෂ සියල්ල තම සම්ප්‍රදායික ඡන්ද ගොඩවල් වෙන්කර ගැනීම සඳහා කුමන කරුණක් ගැන හෝ කතා කරමින් 'ජාතිවාදය' අවුස්සාලීම කරලියට ගැනේ.

13 ආවේ කොහෙන්ද ?

අද 13 ගැන කතා කරන දේශපාලඥයෝ ඊට අදාල වැදගත්ම සාධකය ඇඟට නොදැනීම ඉතා පහසුවෙන් අමතක කර ඇති සෙයකි. එසේ කිරීමෙන් ප්‍රශ්නයේ බරපතල පැත්ත මුළුමනින්ම මග හැරීමට ඔවුන්ට හැකිය. ඇත්ත ඉතිහාසයට ඔවුන් බයය. එය ඔවුන්ට දේශපාලන වශයෙන් ඉතාම අවාසිය. ඒ නිසා එය මග හැරීම හැර, ප්‍රශ්නයේ වල්ගයේ එල්ලීම හැර ඔවුන්ට කළ හැකි අන් යමක් නැත. අපේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව රට තුළ වාසය කළත් විදේශයන්හි වාසය කළත් තේරුම් ගත යුත්තේ මේ බොරුවය. මේ මුලා කිරීමය.

13 පිළිබඳ ගැඹුරින් තේරුම් කරන්නට නම් ටිකක් දිගට කරුණු දැක්විය යුතුය. නමුත් කෙටි ලිපියකින් කරුණු දැක්වීම කළ යුතු බවට අපට බල කෙරී ඇත. එනිසා හැකි තරම් දුරට කෙටියෙන් කරුණු දැක්වීමට උත්සහ කෙරේ.

ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඉන්දියානු ව්‍යාප්තිවාදය පිළිබඳවත් එය ශ්‍රී ලංකාවට එරෙහිව ක්‍රියාත්මක කෙරුණ කෙරෙන ආකාරයත් පිළිබඳව කතා කළේ ජනතා විමුක්ති පෙරමුණ උපත ලැබූ මොහොතේ සිටය. එදා සමහරුන්ට ජනතා විමුක්ති පෙරමුණේ ඉන්දියානු ව්‍යාප්තිවාදය නොපවතින්නත් වගේම ජාතිවාදී (සිංහල ජාතිවාදී) ද විය. ඒ වැරදි මත දේශපාලන ක්ෂෙත්‍රය තුළ ඔරොත්තු දුන්නේ ටික කලකි. දකුණු ආසියා කලාපයේ 'ලොකු අයියා' බවට තමන් විසින් තමන්ව ආරූඪ කරගත් ඉන්දියාව (ඉන්දීය පාලක ධනපති පංතිය - විශේෂයෙන්ම ඉන්දීය කොංග්‍රස් පක්ෂය) සිය ආධිපත්‍යවාදී විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බව ප්‍රදර්ශනය කරන්නට පටන් ගත්තේ 1940 ස් ගනන් වල සිටමය. ඉන්දුනීසියාවේ පැවති බැංඩුං ඉහල පෙලේ සමුළුවේදී ශ්‍රී ලංකාව පිළිබඳව ඉන්දියාවේ එවකට අගමැති ශ්‍රී ජවහල්ලාල් නේරු හැසිරුන ආකාරය එයට කදිම උදාහරණයකි. ඉන්දියාව සිය විදේශ ප්‍රතිපත්තිය පදනම් කර ඇත්තේ "චතුර්වර්ති ක්ෂෙත්‍රයක්" පිළිබඳ මිථ්‍යාවක යම් පමණක නැඹුරු වෙමින්ය.

ඉන්දියානු මහ ආණ්ඩුව ශ්‍රී ලංකාවේ අනන්‍යන්තර දේශපාලන කටයුතු වලට ඇඟිලි ගැසුවේ ශ්‍රී ලංකාව ඊනියා නිදහස ලැබූ වකවානුවේ පටන්මය. ඊටත් පෙර ඉන්දියාවේ හැසිරීම ප්‍රශ්න කළ යුතු ආවස්ථා නැතුවාම නොවේ.

ඉන්දියානු ව්‍යාප්තිවාදයේ රඟ හොඳහැටි ශ්‍රී ලංකාවට දැනෙන්න පටන් ගත්තේ දෙමළ බෙදුම්වාදයේ සන්නද්ධ අංශය බිහිවුතැන් සිටය. 70 මුල් කාලයේදීත් එම සන්නද්ධ ව්‍යාපාරයට ඉන්දියාවේ නිෂ්පාදිත ඩෙටනේටර් දහස් ගනන් ලැබුන බව ජනතා විමුක්ති පෙරමුණ ට නම් රහසක් නොවීය.

1989 ජූලි මසදී බෙදුම්වාදීන් විසින් අටවන ලද බිම් බෝම්බයකට ආරක්ෂක හමුදා සෙබලු 13කට මරු කැඳවන ලදී. එවිට එක්සත් ජාතික පක්ෂයේ නායකයින්ගේ මෙහෙයවීමෙන් "කළු ජූලිය" ලෙස හැඳින්වුන කුප්‍රසිද්ධ දෙමළ සංහාරයක් ඇරඹිණි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා තම පක්ෂයේ මැරයෝ මිනීමැරුම් හා වෙනත් අපරාධ සාහසික ලෙස දියත් කරද්දී දින තුනක් ගතවන තුරුත් අඩු වශයෙන් ඒ බරපතල ව්‍යසනය නැවැත්වීම සඳහා අඩු වශයෙන් ජාතිය ඇමතුවේ නැත. ඒ අවස්ථාවේදී ඉන්දියාවේ ඉන්දිරා කොංග්‍රස් ආණ්ඩුවේ ඇමති පී.පර්ථසාරථි ලංකාවට ගොඩ බැස්සේ බලහත්කාරයෙන් බවටද රාවයක් පවතී. එසේ බලහත්කාරයෙන් ලංකාවට ගොඩ බසින්නට තරම් වූ වාසිදායක තත්වයක් ඉන්දියාවට පක්ෂව රටතුළ ඇතිවූයේ ජේ.ආර්. ජයවර්ධනගේ අදූරදර්ශී, එක්සත් ජනපද අධිරාජ්‍යගැති ප්‍රතිපත්ති හේතුකොටගෙනයි. 1983 ජූලි මාසයේ සිට ශ්‍රී ලාංකීය දෙමළ ජනතාව දස දහස් ගණනින් දකුණු ඉන්දියාවට පැන ගත්තෝය. ඔවුන් අතරින් දස දහස් ගණනක් අදත් එහි ඇති අතාට කඳවුරුවල වෙසෙති. මේ තත්වයද ඉන්දියාව සිය වාසියට ගෙන ලංකාව සමග ඝෝවල් කිරීමටත් ලංකාව යට කර ගැනීමටත් යොදා ගැනීය. එතැන් සිට ඉන්දියාව ශ්‍රී ලංකාවට සිය ව්‍යාප්තවාදී විදේශ ප්‍රතිපත්තිය කොතරම් දුරට ලංකාවේ ස්වෛරීත්වයට එරෙහි යන්න ප්‍රදර්ශනය කළේය. එය කොතරම් ආත්මාණකාරීද යත් වරක් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා බෙදුම්වාදී සන්නද්ධ සංවිධානය යාපනේ වඩමාරච්චි ප්‍රදේශයේදී කොටු කරගෙන සිටිද්දී ඉන්දියාව සිය ගුවන් හමාදාව මුවා ශ්‍රී ලංකා ගුවන උල්ලංඝණය කර බෙදුම්වාදීන්ට පරිජ්පු(ද?) (නැත්නම් ආයුදද?) හෙළා ශ්‍රී ලංකා හමුදාව වඩමාරච්චි ප්‍රදේශයෙන් පිටට ගන්නට කටයුතු කළ අතර ප්‍රතාකරන් එදා ලැබුණු ඒ ඉඩකඩ යොදාගෙන පණ බේරා ගත්තේය. එසේ නොවන්නට බෙදුම්වාදී යුද්ධය ඒ තැනට නවතින්නට ඉඩ තිබුණි.

ඉන්දිරා ගාන්ධි ආණ්ඩුව 1983 සිට එළිපිටම ලංකාවේ බෙදුම්වාදීන්ට ඉන්දීය හමුදා කඳවුරුවලදී අවි පුහුණුව දුන්නේය. මුදල් හා අවි සැපයීය. රාජ්‍යතාන්ත්‍රික වටිනාකම් දුන්නේය. ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවට බේදුම්වාදී ත්‍රස්තවාදය සමග සාකච්ඡාවට එකඟ වන්නට සිදුවූයේ ඒ ශක්තියට යටවෙමින්ය.

හරියටම අවුරුද්දක් ඇතුළත බෙදුම්වාදී ත්‍රස්තවාදය මුලිනුපුටා දැමිය යුතුයැයි එවකට හමුදාපති සිය බෑණනුවන් වූ බ්‍රයන් වීරතුංගට නියෝග කළ ජේ. ආර්. ජයවර්ධන ක්‍රමානුකූලව දණ නැමූ හැටි ලජ්ජා සහගතය. යැංකි ඩිකී ශ්‍රී ලංකාවේ දේශපාලන දැවැන්තයෙක් ලෙස පෙනී සිටියත් යැංකි ඩිකීට ඇමරිකා එක්සත් ජනපද මතුරාගෙන්ද උදව් ලබා ගත නොහැකි විය. උතුරට ගිය බ්‍රයන් වීරතුංග එහි තරුණ, මහළු පුරවැසියන් ඝාතනය කරමින් ගෙන ගිය භීෂණය නිසාම එකල පැවති ආණ්ඩුවට කිසිවකු උදව් කිරීමට ඉදිරිපත් නොවීම පුදුමයක්ද නොවේ. ඒ භීෂණය නිසා සිදුවූයේ බෙදුම්වාදයට එරෙහිව සිටි උතුරේ දෙමළ ජනයා බෙදුම්වාදී ත්‍රස්තවාදයේ තුරුල්ලට තල්ලුවීමය.

දේශපාලන දැවැන්තයෙක් ලෙස පෙනී සිටි ජේ. ආර්. ජයවර්ධන විශේෂයෙන්ම බෙදුම්වාදීන් සමග කළ තිම්පු සාකච්ඡාවලදී බෙදුම්වාදයට අතිශයින්ම වැදගත් කොන්දේසිවලට එකඟ විය. ඉන් එක කොන්දේසියක් වන්නේ ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිකත්වය ජාතියක් බවට පිළිගැනීමය. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස්වරයා ලෙස වැඩ භාරගත් ජේ.එන්.ඩික්සිත්ගේ භූමිකාව ජනතා විමුක්ති පෙරමුණේ දැඩි විවේචනයට ලක්විය. එතරම් තදබල විවේචනයක් කරන්නට තරම් සෙසු පක්ෂ කිසිවකට කොන්දක් තිබුණේ නැත. ජනතා විමුක්ති පෙරමුණ ඉතා නිවැරදි ලෙස ඩික්සිත් හඳුන්වනු ලැබුවේ "ශ්‍රී ලංකාව භාර ඉන්දීය විසුරේ" ලෙසයි.

ජේ.ආර්. ජයවර්ධන ශ්‍රී ලංකාවේ අභිමානය හා ස්වෛරීභාවය කොතරම් නින්දාවට ලක් කළේද යත් 1987දී ඔහුගේ ඇමති මණ්ඩලයට සහභාගී වී එය ඇමතීමට (එයට නියෝග දීමට යන්න වඩා නිවැරදිය) ඩික්සිත්ට ඉඩ දුනි. ඉතින් ඩික්සිත් "ඉන්දීය විසුරේ" ලෙස හැඳින්වීමෙන් ජනතා විමුක්ති පෙරමුණ කළේ වරදක්ද? නැත. ශ්‍රී ලංකාවේ අභිමානය , ස්වෛරීභාවය වෙනුවෙන් පෙනී සිටියේ ඒ වන විටත් අසාධාරණ ලෙස තහනමට ලක්ව තිබුණු ජනතා විමුක්ති පෙරමුණ පමණි.
1987 ජූලි වන විට "ඉන්දීය විසුරේ" ශ්‍රී ලංකාව මත බෙදුම්වාදීන් වෙනුවෙන් ව්‍යවස්ථා සංශෝධනයක් පටවන්නට සමත් විය. ඒ සංශෝධනය අනෙකක් නොව අද වන විට කඩදාසි වොන් සිය ගණනක ලියැවුණු කුප්‍රකට ඉතිහාසයක් ඇති 13 සංශෝධනයයි. ඒ පිළිබඳ ගිස් කතා තවමත් අවසාන නැත.

එය අඩංගු 1987 ජූලි 29 දා අත්සන් කෙරුණු " ඉන්දු ලංකා ගිවිසුම"නොහොත් ජනතා විමුකති පෙරමුණ නිවැරදි ලෙස හඳුන්වා දුන් "දෙවැනි උඩරට ගිවිසුම"මගින් මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය ශ්‍රී ලාංකාව මත පටවන්නට ඉන්දියාව සමත් විය.

13 වැනි සංශෝධනය ශ්‍රේෂ්ඨාධිකරණයේදී අනුමත "(නො)වූයේ"බෙදුනු තීන්දුවක් ලෙසය. කෙසේ වෙතත් ශ්‍රෙෂ්ඨාධිකරණයේ එක් එක් විනිශ්චයකාරවරුන් ලියූ වෙන් වෙන් වූ තීන්දු කියවූ පසු කෙනෙකුට නිරායාසයෙන් තේරුම් යන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සංශෝධනය අනුමත නොකළ බවයි. අනික් අතට එය අනුමත කිරීම සඳහා ජනමත විචාරණයක් පැවැත්විය යුතු බවය. 1983 මහ මැතිවරණය "ගිල දැමූ"ජේ. ආර් ජයවර්ධනට ජනතාව මත 13 පැටවීම මහ කජේජක් වූයේ නැත. ඒ නිකමම නොවේ. ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව ගාලු පාර, මීගමු පාර, නුවර පාර, හයිලෙවල් පාර ආදී ප්‍රධාන පාරවල් දිගේද, ගම් දනව් තුළදීද, දශ ලක්ෂයකට වඩා ජනතාව පෙළපාළිවලින් කොළඹට ඇදී එමින් සිටියදීය. 13 මේ රටේ නීතියට එකතු කිරීම සඳහා සාමකාමී ලෙස එයට විරෝධය පළකළ ශ්‍රේෂ්ඨ මිනිසුන් අතරින් 104දෙනෙකු මහ දවල් මහ පාරේ ඝාතනය කරමින්ය. ඒ වීරවරුන් වීරවරියන් 104 දෙනාට අමතරව තවත් ලක්ෂ ගණනක් වූ සෑම දේශපාලන පක්ෂයකටම අයිති ශ්‍රේෂ්ඨ මිනිස්සු එදා 13ට විරුද්ධව පෙළපාලි ගිය බවත් ඔවුන් අතරින් වැඩි දෙනා අදටත් ජීවතුන් අතර සිටින බවත් අමතක නොකළ යුතුය. ඔවුන්ට ඔවුන් ගැන ආඩම්බර විය හැකිය. එදා ඔවුන් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය යටතේ විරෝධය දක්වන්නට කිසිදු පසුබෑමක් නොදැක්වූහ. හෙට දිනයේදීත් එය එසේම වනු ඇත.

13 ශ්‍රී ලංකාවට ගෙන ආ ගිවිසුම කොළඹදී අත්සන් කෙරෙන මොහොතේදී ම ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර වෙරළට ඉන්දීය ආරක්ෂක හමුදාවේ ලක්ෂයක් හටයන්ද ඔවුන්ට අවශ්‍ය " උපකරණද" ගොඩබාන ලදී. එසේම කොළඹ අවට මුහුදේ ඉන්දීය යුද නැව් නවතා තිබුණි. ඒ ලංකාවට ආරක්ෂාව සපයන්නට හෝ ලංකාව අස්වද්දන්නට නොවේ. මේවා දැන් සමහරුන්ට අමතකය.
මේවා අමතක අය ඩික්සිත්ගේ "කොළඹ භූමිකාව"(Colombo Assignment) කියැවීම යෙහෙකි.

දැන් 13 පිළිබඳව බෙරිහන් දීමක් අරඹා ඇත්තේ උතුරේ පළාත් සභා ඡන්දය පැවැත්වීම නතරකිරීමට හෝ පැවැත්වුවහොත් එය දිනාගැනීමටයි. ඒසෙම මහින්ද රාජපක්ෂ රට ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික

39 වන පිටට